


# නීතිය නොදැන සිටීම සමාවට හේතුවක් නොවේ

**නීතිඥ සුගත් අතපත්තු**
නීති නිලධාරී - පරිසර යුක්ති කේන්ද්‍රය

ශ්‍රී ලංකාවේ පරිසර නීතිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ප්‍රධාන වශයෙන් ම ඊට අදාළ නීති අණපනත් 100 කට ආසන්න සංඛ්‍යාවක් ඇත. ඊට අමතරව පරිසර අමාත්‍යවරයා විසින් වරින් වර නිකුත් කරනු ලබන ගැසට් නිවේදන, නියෝග, රෙගුලාසි හා චක්‍රලේඛ සමස්ථයක් ලෙස මුළු රටටම ද එක් එක් සුවිශේෂී පරිසර පද්ධතින්ට වෙන් වෙන් වූ වශයෙන් ද ක්‍රියාත්මක වේ. නීතිය නොදැන සිටීම සමාවට හේතුවක් නොවේ. යන සරල නෛතික සංකල්පය තුළ විමසා බැලීමේ දී අපට පැහැදිලිව දැක ගත හැකි වන්නේ පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉතා දැඩි වූ නීති රාමුවක් මෙරට නීති පද්ධතිය තුළ තිබුණ ද විටෙක ජනතාවගේ ඒ පිළිබඳ ඇති දැනුවත්භාවය අල්ප වීම තුළත්, පවත්නා නීතිය ප්‍රයෝගික තලයේ දී නීත්‍යානුකූලව ක්‍රියාත්මක නොවීමත්, නීතිය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින රාජ්‍ය නිලධාරීන් සිය වගකීම හා යුතුකම නිසි පරිදි ඉටු නොකිරීමත් තුළ සර්ව සාධාරණ ලෙස පරිසරය සුරක්ෂිත වන පරිදි පුරවැසි පරිසර අයිතීන් නිසි පරිදි භුක්ති විඳීමට අවකාශයක් සැමට සමාන ලෙස ඉටු නොවන බවයි.

1980 අංක 47 දරණ ජාතික පාරසරික පනත යනු, සමස්ථයක් ලෙස මුළු රටටම අදාලව ක්‍රියාත්මක වන පරිදි පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඇති කරන ලද ජාතිකමය වශයෙන් වැදගත් පනතකි. මෙම පනත 1988, හා 2000 යන වර්ෂවලදී සංශෝධනයට ලක්ව ඇත. පනතේ විධි විධාන ප්‍රයෝගික තලයේ දි ක්‍රියාත්මකභාවයට පත්කරනු ලබන්නේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති මධ්‍යම පරිසර අධිකාරියයි. මධ්‍යම පරිසර අධිකාරිය බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව පළාත් මට්ටමේ, දිස්ත්‍රික්ක මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ අනුයෝජිත ආයතන හා ඊට අනුයුක්ත නිලධාරීන් ඇත. මහා පරිමාණ ව්‍යාපෘතින් ජාතික මට්ටමේ සංවර්ධන යෝජනා ක්‍රමවලදී සකස් කරනු ලබන පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට (EIA) හා සමහර අවස්ථා වලදි මූලික පාරසරික පරීක්ෂණ (IEE) ක්‍රියාවලියේ දී ඒ සඳහා අනුමැතිය ලබා දිමේ ප්‍රධානතම ආයතනය ලෙසත්, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් ලෙසත්, පරිසර ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීමේ ආයතනයක් ලෙසත් වැදගත් වේ. විශේෂයෙන් පනතේ 4 වන කොටසෙහි පරිසර සංරක්ෂණය සම්බන්ධව අන්තර්ගත කරුණු වලදි පස, දේශගුණය, දේශීය ජල තීරය දූෂණය වීම, වායුගෝලය දූෂණය හා අපද්‍රව්‍ය බැහැර කිරීම යනාදි කරුණුවලට අදාල නීති තත්වය පැහැදිලි කොට ඇති සමස්ත පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ඇති කරන ලද සුවිශේෂී පනතක් ලෙස ජාතික පාරසරික පනත හඳුන්වා දිය හැකිය. පනත පැන වූ දින පටන් අද දක්වා අමාත්‍යවරයා විසින් පනතේ වගන්තීන්ට අනුකූලව පනවා ඇති ගැසට් නිවේදන රාශියක් අද වනවිට නීතිය ක්‍රියාත්මක කිරීමේදි භාවිතයට ගනු ලැබේ.

අවස්ථා ගණනාවක දී සංශෝධනයන්ට ලක්ව ඇති 1907 අංක 02 දරණ වන සංරක්ෂණ ආඥා පනත ද මූලිකවම වනාන්තර ආරක්ෂා කිරීම උදෙසා පනවන ලද පනතක් ලෙස හැඳින්විය හැකිය. වන සංරක්ෂණ දෙපාර්මේන්තුව පනතේ අරමුණු ප්‍රයෝගිකව ක්‍රියාත්මක භාවයට ලක් කරයි. ඒ සඳහා වනසංරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සිට දිවයින පුරා වනාන්තර ආරක්ෂා කිරීම උදෙසා නියෝජ්‍ය වනසංරක්ෂක නිලධාරීන්ගේ, දිස්ත්‍රික් වන නිලධාරි, අඩවි වන නිලධාරි, බීට්ටු නිලධාරි හා ක්ෂේත්‍ර වන නිලධාරීන් ගෙන් සමන්විත විශාල කණ්ඩායමක් එහි නියමුවෝ ලෙස කටයුතු කරති. විශේෂයෙන් ම පනත ප්‍රකාරව මෙරට වනාන්තර වර්ගීකරණය කොටස් කීපයක් යටතේ බෙදා වෙන් කොට පාලනය කරනු දැක ගත හැකිය.

එනම්,
සංරක්ෂිත වනාන්තර
රක්ෂිත වනාන්තර
ගම්බද වනාන්තර
වෙනත් වනාන්තර

පනතේ 06 වන වගන්තියේ අ සිට ඩ දක්වා අනු වගන්තින්වල නිසි නිළධාරියෙකුගේ අවසරයකින් තොරව සංරක්ෂිත හා රක්ෂිත වනයකට ඇතුලු විම ඇතුලුව වැරදි 18 ක් සවිස්තරාත්මකව දක්වා ඇත.

වන සංරක්ෂණ පනතේ 8 (2) වගන්තිය තුළ දක්වා ඇත්තේ රක්ෂිත වනාන්තර පිළිබඳව පොදුවේ හෝ යම් විශේෂිත රක්ෂිත වනාන්තරයක් පිළිබඳව පනතේ 20 (1) වන වගන්තියෙන් සඳහන් වන කාරණයක් සඳහා නියෝග සෑදිමේ බලය අමාත්‍යවරයාට ඇත.

නීති විරෝධී ආකාරයෙන් සිදු කරනු ලබන සියලු ම වන අපරාධයන්ට අදාළව නීතිය ක්‍රියාත්මක කිරිම හා අධිකරණය හරහා වැරදිකරුවන්ට දඬුවම් ලබා දිමේ දී ප්‍රධාන වශයෙන් අනුකූල කරගනු ලබන්නේ ද මෙම වන සංරක්ෂණ ආඥා පනත වේ.

පරිසරයට අදාල නීති තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ජා කිරීමේදී 1937 අංක 02 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ද සමස්ථයක් වශයෙන් සතුන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පනවා ඇති සුවිශේෂි පනතක් ලෙස හැඳින්විය හැක. මෙය ද අවස්ථා 08 කදී සංශෝධණයට ලක්ව ඇත.

පනතේ අරමුණු ප්‍රයෝගිකව ක්‍රියාත්මක භාවයට පත්කරන්නේ වනජීවි සංරක්ෂණ දෙපාර්මේන්තුවයි. ශ්‍රී ලංකාවේ රක්ෂිත භූමි හා අභය භූමි පාලනය කිරීමේ බලය පනත අනුව වනජිවි සංරක්ෂණ දෙපාර්මේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් රජයේ යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් පනතේ කාර්යක් සඳහා ජාතික රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරිමේ බලය අමාත්‍යවරයාට ඇත.

එසේ නම් කරනු ලබන ජාතික රක්ෂිත භූමිය සම්පුර්ණයෙන් හෝ ඉන් යම් කොටසක්,

තහනම් අඩවියක්

ජාතික වනෝද්‍යානයක්

ස්වභාවික රක්ෂිත භූමියක්

වන පිවිසුමක්

සමුද්‍රිය ජාතික උද්‍යානයක්

සමුද්‍රිය රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කළ හැක.

විශේෂයෙන්ම මෙම පනතේ ආරක්ෂිත නොවන ක්ෂිරපායි සතුන් හා උරගයින් ගේ නාම ලේඛනයක්, දැඩි ලෙස ආරක්ෂිත ක්ෂිරපායි සතුන්ගේ හා උරගයන්ගේ නාම ලේඛනයක්, දැඩි ලෙස ආරක්ෂිත පක්ෂින්ගේ නාම ලේඛනයක් හා එසේ නොවන පක්ෂින්ගේ නාම ලේඛනයක්, කොදු ඇට පෙළ නොමැති ආරක්ෂිත නොවන සතුන්ගේ හා ආරක්ෂිත ශාකවල නාම ලේඛනයක් හා ආරක්ෂිත වෘක්ෂ නාම ලේඛනයක් ලෙස උපලේඛණ 09 කින් සමන්විත වන පරිදි වන සත්ව හා වෘක්ෂලතා පනත සකස් වි ඇත.

මිට අමතරව 1988 අංක 07 දරණ වෙරළ සංරක්ෂණ පනතද ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආරක්ෂා කිරීම උදෙසා පිහිටුවා ඇති ජාතික මට්ටමේ වැදගත් වන පනතක් ලෙස හැඳින්විය හැකි අතර වෙරළ සංරක්ෂණ දෙපාර්මේන්තුව මගින් පනතේ අරමුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබයි.

තවද රජයේ ඉඩම් නීතිය හා සම්බන්ධව සාකච්ඡා කිරිමේදි 1949 රජයේ ඉඩම් ආඥා පනත, 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත, 1979 රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත රජයේ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ පාලනයට යටත් කර ක්‍රියාත්මක වේ.

තවද සමස්ථ පරිසරයේ ස්වභාවික තත්ත්වය වෙනස් කරන මහජනයාට පොදුවේ පිඩාවක් ගෙන දෙන පාරසරිකමය හානියක දි ඊට අදාළ අපරාධ නිතිය ක්‍රියාත්මක කරන දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය හා අනදරය පිළිබඳව ආඥා පනත ද මෙරට ක්‍රියාත්මක වන ඉතා වැදගත් අණපනත් ලෙස හඳුන්වා දිය හැකිය.

